දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 ප්‍රථම වර පරීක්ෂණය - 2018 ජූලි/අගෝස්තු
Bachelor of Arts General (External) Degree Part II Regular Examination 2015 – July/August 2018

ආවිසා 3.1 - ප්‍රායෝගික ආර්ථික විද්‍යාව
ECG 3.1 - Applied Economics

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න

---

01. I. "නැගෙනහිර ආසියාතික රටවල් සමඟ සසඳන විට ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධිය විභව මට්ටමට වඩා බෙහෙවින් පහළ මට්ටමක් ගෙන ඇත." 1948 - 1977 කාල පරිච්ඡේදයේ දී ශ්‍රී ලංකා ආර්ථිකයේ ඌන සාධන මට්ටම් කෙරෙහි බලපෑ හේතු පැහැදිලි කරන්න.
(ලකුණු 10 යි)

II. 1977 දී හඳුන්වාදුන් බාහිරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති රාමුව ශ්‍රී ලංකා ආර්ථිකයේ කැපී පෙනෙන වෙනස්කම් සමූහයක් ඇති කිරීමට සමත් වූ ආකාරය පෙන්වා දෙන්න.
(ලකුණු 10 යි)

02. වර්තමාන ගෝලීය ආර්ථික පසුබෑස්මට තුඩු දුන් සාධක පෙන්වා දී ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි එය කෙසේ බලපා ඇත්දැයි විස්තර කරන්න.
(ලකුණු 20 යි)

03. I. මෑත භාගයේ දී ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර තරගකාරිත්වය පිරිහීම කෙරෙහි බලපා ඇති සාධක කවරේ ද?
(ලකුණු 10 යි)

II. ශ්‍රී ලංකාවට මෑත කාලීනව සෘජු විදේශ ආයෝජන වේගයෙන් ගලා ඒම වර්ධනය වීම කෙරෙහි අහිතකර ලෙස බලපානු ලැබූ සාධක කවරේ ද?
(ලකුණු 10 යි)

04. I. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ පසුබෑමට ඉවහල් වූ සාධක පැහැදිලි කොට ඉදිරි කෘෂි නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට අනුගමනය කළ යුතු ක්‍රමෝපායන් සැකෙවින් දක්වන්න.
(ලකුණු 10 යි)

II. "අතිවිශාල වෙළෙඳ හිඟය ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ අර්බුධයට මූලිකම හේතුව බවට පත් වී ඇත" ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. මේ සඳහා යොදා ගත හැකි විසඳුම් ක්‍රියා මාර්ග ද පෙන්වා දෙන්න.
(ලකුණු 10 යි)

05. I. මානව සංවර්ධන ප්‍රවේශය මත පදනම් ව සංවර්ධන සංකල්පය අර්ථ විග්‍රහ කරන්න.
(ලකුණු 04 යි)

II. ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන මට්ටම, දකුණු ආසියානු කලාපීය රටවල් සමඟ සසඳන්න.
(ලකුණු 06 යි)

III. ශ්‍රී ලංකාවේ චිරස්ථායි මානව සංවර්ධන මට්ටමක් සහතික කිරීමේ දී මුහුණ දීමට සිදුවන අභියෝග පැහැදිලි කරන්න.
(ලකුණු 10 යි)

06. I. ආදායම් දරිද්‍රතාවයේ ප්‍රධාන පැතිකඩ දෙකක් වන නිරපේක්ෂ දරිද්‍රතාව (absolute poverty) සහ සාපේක්ෂ දරිද්‍රතාව (Relative poverty) යන සංකල්ප අර්ථ දක්වා ඒවා මිනුම් කිරීමට අදාළ වන දර්ශන පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.
(ලකුණු 07 යි)

II. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ මෑතකාලීන ප්‍රවනතා පිළිබඳ විග්‍රහයක් කරන්න.
(ලකුණු 10 යි)

III. පසුගිය කාලසීමාවේ ශ්‍රී ලංකාවේ ජාතික දරිද්‍රතා මට්ටම පහළ වැටීම සඳහා දායක වී ඇති සාධක පහක් හඳුනා ගන්න.
(ලකුණු 05 යි)

07. I. ශ්‍රී ලංකාවේ ජනගහනයේ වර්ධනය සඳහා පදනම් වන ප්‍රධාන ප්‍රජා විද්‍යාත්මක සංරචක මොනවා ද?
(ලකුණු 03 යි)

II. වියපත්වීමේ දර්ශකය (Index of aging) නිර්වචනය කර ශ්‍රී ලංකාව විෂයෙහි එහි ප්‍රවනතා පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.
(ලකුණු 05 යි)

III. ශ්‍රී ලංකාවේ තරුණ ජනගහනය වයස්ගත ජනගහනය බවට පරිවර්තනය වීමේ සමාජ - ආර්ථික ප්‍රතිවිපාක පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.
(ලකුණු 12 යි)

08. පහත සඳහන් ඒවා පිළිබඳ ප්‍රමාණවත් සටහන් ලියන්න.

I. ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා රේඛාව යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාව

II. ශ්‍රී ලංකාවේ මෑතකාලීන සේවා වියුක්ති මට්ටම සහ එහි ප්‍රවනතා

III. ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය (Demographic transition) සහ වයස් ව්‍යුහ සංක්‍රාන්තිය (Age structure transition)

IV. ශ්‍රී ලංකාවේ මෑත කාලීන උද්ධමන ප්‍රවනතා
(එක් කොටසකට ලකුණු 05 යි)

xxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxx